## සත්ත්ව ලෝකය

# ක්ලෝනීකරණයෙන් උත්පාදවන වඳවී යන සතුන්

නව තාක්ෂණ දියුණුවත් සමග ඉදිරියට යන වත්මන් ලෝකයේ සිදු කෙරෙන නව අත්හදා බැලීම් තුළින් මිනිසාට යහපත් ප්‍රතිඵල මෙන්ම අයහපත් ප්‍රතිඵල රසක් අත්විඳීමට සිදුවේ. මෙම දියුණු තාක්ෂණය හේතුවෙන් ලොවින් තුරන්වී යන ජීවීන් ක්ලෝනීකරණය මගින් උත්පාද කිරීමට ලැබීම සැබවින්ම මිනිසා ලැබූ භාග්‍යයකි. 'ක්ලෝනීකරණය' සොයා ගැනීමේ පෙරළිය ජෛව රසායන විද්‍යාව නම් සාගරයෙන් මීළඟ සහස්‍ර වර්ෂ වෙරළට ළඟාවූ එක් රළ පහරක් වැනි ය. මෙවන් විශාල පෙරළියක ආරම්භය වූයේ 1997 වර්ෂයේ 'ඩොලී' නම් බැටලු පැටවා සොයා ගැනීමෙනි.

කෙසේ වෙතත්, පසුගියදා ලොව පුරාම සිටින වඳවී යන සතුන්ගේ පැවැත්මට නව පිටුවක් පෙරළමින් පටක විද්‍යාවේ ආනුභාවයෙන් "නෝහා" උපත ( NOCH)ලැබීය. කුළු හරක් වර්ගයට අයත් "නෝහා" (NOHA)ලොව පුරා සිටින්නේ 34000 ක් තරම් අඩු සංඛ්‍යාවකි. ඒ අනුව වඳවී යන සතුන් අතුරින් ක්ලෝනීකරණයට භාජනය වූ ප්‍රථම සත්වයා "නෝහා" වේ. එපමණක් නොව, මෙය එක් වර්ගයක සතෙකුගේ පටක වෙනස් වර්ගයක සතෙකු හා මුසුවී නිරෝගී ජීවියකු උත්පාදවූ අවසථාවයි. (ගුවර් වර්ගයේ පිරිමි කුළු හරකෙකුට අයත් පටක සාමාන්‍ය දෙනකුගේ සිරුරේ තැන්පත් කිරීම.)

තව සංගණන වාර්තා අනුව ලෝකයේ ශීඝ්‍රයෙන් වඳවී යන ක්ෂීරපායී සතුන් සංඛ්‍යාව 169 සිට 180 දක්වා ඉහළ ගොස් ඇත. මිත් ප්‍රධාන ගණයේ ක්ෂීරපායී සතුන්ගේ සංඛ්‍යාව 13 සිට 19 දක්වාත් කැස්බෑවන්ගේ සංඛ්‍යාව 10 සිට 24 දක්වාත් හා පක්ෂීන්ගේ සංඛ්‍යාව 168 සිට 182 දක්වාත් ඉහළ ගොස් ඇත. එපමණක් නොව චීනයේ වනාන්තරවල ජීවත්වන යෝධ පැන්ඩා, සුමාත්‍රාවේ කෙලාටියා, රයිනෝ වැනි ක්ෂීරපායී සතුන් ශීඝ්‍ර ලෙස වඳ වී යාමේ තර්ජනයට ලක්ව ඇත. ඒ අනුව, ඉදිරි අනාගතයේදී වඳවී යන සතුන් ක්ලෝනීකරණය මගින් උත්පාද කිරීමට හැකියාව ලැබෙන බව දැනටමත් විද්වතුන් අනාවැකි පළකොට හමාර ය. සැබවින්ම එය මිනිසා ඉදිරියට තැබූ යෝධ පිම්මකි.

මෙයට කලකට ඉහතදී තල ආධාරයෙන් ඔසිලට්, කොටියා, ගෝරිල්ලා, බැබූන් වැනි සතුන් බිහි කළත් එය තරමක් අසීරු ප්‍රවේශම් සහිතව කළ යුත්තකි . නමුත් පටක ආශ්‍රයෙන් ක්ලෝනීකරණය ප්‍රකට දෙයකි. සියලුම සතුන් සරු බවින් අඩු වුවත් ක්ලෝනීකරණයට සුදුසුකම් ලබති. ඒ අනුව ක්ලෝනීකරණය වඳ වී යන සතුන්ගේ සංඛ්‍යාව වැඩි කරලීමට මෙන්ම ස්වාභාවික ක්‍රම අනුව සතුන් බෝවීම අඩු කිරීමට සමත් දුර්ලභ සිදුවීමකි.

මේ දිනවල පර්යේෂකයන්ගේ අවධානයට ලක්වී ඇත්තේ සාරවත් ලෙස බෝ කිරීමට අපහසු "පැන්ඩා" ක්ලෝනීකරණය කිරීමට ය. ඒ අනුව දැනටමත් මිය ගිය පැන්ඩාවන්ගේ පටක අධිශීත කර ඇත. එපමණක් නොව බියුකාඩෝ එළුවාගේ අවසානම සත්වයා වූ "සෙලියාගේ" පටක මේ වන විටත් ශීතාගාර වල තැන්පත් කර ඇත. ඒ අනුව මී ළඟ ග්‍රීෂ්ම ඍතුවේදී කුඩා බියුකාඩෝ එළු පැටවුන්ගේ පැමිණීම අපේක්ෂා කළ හැකි ය.



සුමාත්‍රාවේ ව්‍යාඝ්‍රයා : 400 කට අඩු ප්‍රමාණයක් තෘණ භූමිවල හා වැසි වනාන්තරවල ජීවත් වේ. බළල් වර්ගයේ සතෙකුට ක්ලෝන කිරීමට නියමිත යි.



ගුවර් : 36,000 ක් පමණ ආසියාවේ ගිනිකොන හා ඉන්දියාවේ වනාන්තරවල තෘණ භූමිවල වාසය කරයි. සාමාන්‍ය කිරි දෙනකට ක්ලෝන කිරීමට නියමිත යි.



ටෙක්සාස් හි ඔයිලට් : 250 නට අඩු ප්‍රමාණයක් ඇමරිකාවේ දකුණු දිග කෙලවරේ සහ මෙක්සිකෝවේ වාසය කරයි. බැළලියකට ක්ලෝන කිරීමට නියමිත යි.



කඳුකර බෙන්ගෝ : 50 දෙනෙකු පමණ කෙන්යාවේ කඳුකර වනාන්තරවල ප්‍රදේශයක ජීවත් වේ. ඊලන්ඩ් වැනි කුර ගව දෙනකුට ක්ලෝන කිරීමට නියමිත යි.

❑

නිව්ස් වීක් ඇසුරින්

ප්‍රියන්ති තිරාණගම